# 26

පොලිස් පති පියතිලක, බිමල්ගේ අතින් ගත් ලිපියත් ජේසාරුවත් දෙස විමසුමෙන් බලා සිටියේය.

බිමල් පොලිස් කාර්යාලයට පැමිණියේ තනිව නොවේ. තිරවේලාත් සමගිනි.

රුප්පාව පාරෙන් පිටවූ බිමල් කෙළින්ම ගියේ තිරවේලා සොයා ගෙනයි. තව දුරටත් ඇගෙන් සැඟවිය නොහැකි බැවින් ඔහු තමා සොයාගත් සියල්ල ඇයට හෙළි කළා පමණක් නොව තාත්තා හා හැඳිය එකට සිටින ජේසාරුව හා ඉරා වෙන්කොට තබා ගත් ලිපි කැබැල්ලද ඇයට පෙන්වීය.

ඈ ඉන්ස්පෙක්ටර් පියතිලකට දුරකථනයෙන් කතා කළ විට කාර්යාලයට එන්නැයි ඔහු කියා සිටි බැවින් බිමල් ඈ සමග කුලී රියක් ගෙන පොලිස් ස්ථානයට ගියේය.

පැහැපත් මුහුණින් යුතු වූ පියතිලක මැදිවියට ළංවූ කරුණාවන්ත කෙනෙක් විය. තිරවේලාව ඔහු හඳුනා සිටි හෙයින්දෝ ඔහුට සියල්ල තේරුම් කර දීමද අපහසුවක් නොවීය.

"අපිට මේ ගැන මීරිගමෙන් පත්‍රිකාවක් ආවා" පියතිලක කීවේය. "තාත්තා ගිහින් දැන් දවස් පහක් නේද?"

"ඔව්"

"ඇයි කලින් පැමිණිලි කෙරුවෙ නැත්තෙ?"

"අපි හිතුවෙම තාත්තා කතරගම අයියණ්ඩිට එකේ ඇති කියලා. මේ පින්තූරෙත් ලියුමත් ලැබුණෙ ඊයේ පෙරේදා."

"හරි - හරි." පියතිලක යළිත් ජේසාරුව දෙස බැලුවේය. "මේ තමුන්ගෙ පියා කියල හොඳටම විශ්වාසයි ?"

"ඔව් සර් !"

"ඉතින් - මේ කියන කාලගුවෙ - කාලිංග මාන්තයා ගැන තමුන්ගෙ අදහස ඇයි ?"

"මං දන්න තරමින් සර් - මං ගඟසිරි හෝටලේදි ඔය කියන උදය සිරි මුණ ගැහුණා"

"ඒ කවදද ?"

"ඊයේ - උදේ සර්."

"ඊයෙ උදේ ?"

"ඔව් සර් මං ආවෙ ඒකට. එයා තමයි මට කිව්වෙ ගන්දර කලපුවට නාත්තව එක්කන් ගියා කියලා." බිමල් දැන් බෙර ගොතන්නට වුනේ තමා සොයාගත් තොරතුරු පාස්සින්නටත්, සෝමතිලකව හවුල් කර නොගැනීමටත්ය.

"කෝ ඉතින් මිනිහා"

"ඊයෙම බෝට්ටුවකින් මිනිහා ගන්දර කලපුවට ගියා."

"කොහොමද දැන ගත්තෙ ?"

"මට කියල ගියෙ."

"ඉන් පස්සෙ ?"

"ඉන්පස්සෙ ආරංචියක් නෑ"

"මේ පින්තූරෙ කලපුවෙන් බව දන්නෙ කොහොමද ?"

"පේන්නෙ නැද්ද සර් අර එගොඩෙන් පිටුපස්සෙ පොල්ගස් පේන්නෙ." බිමල් මේ සේයාරුවම තෝරාගත්තේ එබැවිනි.

"පොල්ගස් තියෙන්නෙ කලපුවෙ විතරද පුතා ?"

"නෑ සර් - මේ පොල්ගස් සත්තට වැඩිල තියෙන්නෙ - ඒකයි."

"රහස් පරීක්ෂකයෙක් වගේ ? මි ?" පියතිලක සිනාසුනේය. "හොඳයි අපි මේ දැන පරීක්ෂණයක් කරන්නම් හැබැයි පුතා කලුගල් වල ඔලුව හප්ප ගන්න එපා තේරුණාද ? මි ? කාලිංග දියවඩන කියන්නෙ ඉතාම බලගතු - සල්ලිකාරයෙක්. එයාට කාගෙවත් දෙයක් ඕන නෑ මමත් ඔය මන්දිරයට ගිහින් තියෙනවා. අතට පයට දැසි දස්සො ඉන්න මාලිගාවක් වගේ තැනක්. ඒ තැන් වලට ඇමෝටම යන්නත් බෑ මි ?"

"මට ඒක තේරුණා සර්."

"කාලිංගව සැක කරන්න එපා. සැක කරලත් වැඩක් නැහැ. මිනිහා නිර්දෝෂයි."

"එතකොට මගේ තාත්තා ?"

"මට තේරෙනවා මේ පුතාගෙ තියෙන හිත් වේදනාව."

"තාත්ත හොඳම පත්‍ර වාර්තා කරුවෙක්."

"පත්‍ර වාර්තා කරුවො කියල විශේෂයක් නෑ පුතා. ලෝකෙ කොතැනත් වරින් වර මිනිස්සු අතුරුදහන් වෙනවා. සමහර උදවිය කැමැත්තෙන්ම හැංගිලා යනවා. සමහර වන වදිනවා. සමහර ගිහින් ආයෙත් එනවා. නැතිවෙච්ච උදවිය හම්බවෙනවා. සමහර අය - සමහර දය එයි - මැරෙනවා. මළ සිරුරු හම්බ වෙන තොවල් තියෙනවා. සමහර වෙලාවට කිසිම හෝඩුවාවක් නැති වෙලා යනවා."

"හෝඩුවාවල් - මේ පින්තූරේ - මේ ලියුම් කෑලි. මේ- මේ උදය සිරි - හග සිරි හෝටලේ උදය සිරි" විමල් නොඉවසිල්ලෙන් කියෙව්වේ.

"පුතා! පුතා! කලබල වෙන්න එපා! කලබල වෙන්න එ-පා-- ඔයා කලබල වෙනවා. තාත්තා නිසා.. ඉතින් මෙහෙම පින්තූරයක් තියෙනවා කියන්නෙ- තාත්තා මැරිලා නෑ- හරිද?"

"හරි- වෙන්න පුළුවන්."

"ඉතිං අපි උත්සාහ ගනිමු මේක විසඳන්න."

"මේ උදය සිරි හොයා ගත්තොත්."

"අපි උත්සාහ කරමු."

"ගන්දර කලපුවෙ."

"හරි අපි ගන්දර කලපුවෙ සොයමු. එතනට යන්න බෑනෙ. නේද? අපි සර්ච් වොරන්ට් එකක් දාල, කාලිංගගෙ වලව්ව සෝදිසි කරන්නං හරිනෙ? ඒකට අපිට ඉඩකඩ කාල වේලා දෙන්න. පොලීසිය කින් කරන්නෙ ඒකනෙ? අපරාධ මර්දනය. අපරාධ තුරන් කිරීම- මිනිසුන්ට සාමකාමීව සහ ජීවනයෙන් ඉන්න ඉඩ සැලසීම."

"තේරෙනවා සර්."

"හොඳයි පුතා ගෙදර ගිහින් අම්මව බලා ගන්න. අම්මා අසනීපෙන් කිව්වනෙ?"

"ඔව් සර්."

"අපි හොයල බලන්නං. දැන් යන්න. අපි දැනුම් දෙන්නං අපේ වග විභාග ප්‍රතිඵල."

"ස්තූතියි සර්. බොහොම ස්තූතියි."

නිමල් අසුනෙන් නැංගේ පියතිලක කෙරෙහි ඇති විශ්වාසයකිනි. පියතිලක කතා කළේ ස්ථිර සාර ආකාරයකින් සිත් ගන්නා සුළු විලාසයකිනි.

නිමල්ට දින ආහාරය පවා අමතකව ගොස් තිබිණි. නිරංජලා හා පෙරලා ඇගේ ගෙදරට ගමින් විට එඩිනා දවල් බත පිළියෙල කර තිබුණාය.

කෑම මේසය ළඟදී නිරංජලා හා කතා බහේදී නිමල් ඇයට හෙළි නොකළේ මේසා මුණ ගැසීම ඇය හා රාත්‍රිය ගත කිරීම වැනි කාරණාය. එහෙත් විජයදාස බෝට්ටුව ළඟදී කී කරුණු සිය නොසැකිල හෙළි කළේය. උදයසිරි බෝට්ටුවකින් ගන්දර කලපුවට යාම පමණක් නොවේ - කලපුවේ වලව්වේ පවත්වෙන සාදයන් - ඒවාට යන එන බලවත්, ධනවත් අමුත්තන්, ගිල්බා දූපත හා බෝට්ටුවේ ගමන් ගන්නා, සමන ලියන්, මේ සියල්ල ගැන නිරංජලා අසා සිටියේ රසවත් කතන්දරයක් අසන ආකාරයෙනි.

"ඔයා හිතන්නෙම මල්ලි - තාත්තා ඔතන ඉන්නව කියලද ?"

"ඔව්."

"මොනවටද ?"

"මට හිතෙනවා - තාත්තා පොතක් ලියනව කිව්ව නං ඔතන ඇති - පොතක් ලිය ලියා."

"ඉතින් නරකද ?"

"නරක නෑ. ඒ උනාට මට හිතෙනවා - තාත්තට අපිත් එක්ක සම්බන්ධ වෙන්න බෑ කියලා"

"ඇයි එහෙම හිතෙන්නෙ ?"

"මට එහෙම දැනෙනවා. තාත්තා අපිව අමතක කරන ජාතියෙ කෙනෙක් නෙමෙයි."

"මිනිස්සුන්ගෙ හිත් වෙනස් වෙනවා මල්ලි."

"ඔව් - ඒක හරි."

අනතුරුව නිමා කලපුව අසලට ඇදී ගිය ආකාරයෙන්, විදුලි සර යෙදූ බෝට්ටුව ගැනත්, ලොකු දිලිසෙන කළු රථයේ ආ අමුත්තා ගැනත් නිමල් යළිත් මතක් කළේය.

"ඔතන ඇතුලට යන්න පුළුවන් නං මං තාත්තව හොයා ගන්නවා.

ගන්නවාමයි " බිමල් ස්ථිර සාර හඬින් කීය.

"ඔයාට යන්නම ඕනද මල්ලි ?" නිරංජලා ඇසුවේ බිමල් දෙස විමසුමෙන් බලා සිටියාට පසුවය.

" ඔයා හිතන්නෙ අක්කෙ- ඔයාට පුළුවන්ද ඉන්ස්පෙක්ටර් පියතිලකට කියලා මාව ඇතුළට එක්කන් යන්න ? "

නෑ කියන්නට නිරංජලා හිස සැලුවාය. " කලු හලක ඔලුව ගහගන්න බෑ කියල පියතිලක කිව්වනෙ මල්ලි. ඔය කියන කාලිංග දියවඩනගෙ සල්ලි වලට බලයට සේරම යටයි. මනී ටෝක්ස් බුල් ෂිට් වෝක්ස් කියල කතාවක් තියෙනවනෙ මල්ලි- කතා කරන්නෙ සල්ලි- අනිත් සේරම කතා ගොළු වගේ- ඒව, කතා විතරයි. "

"කතාව දෝලාවෙන් ගමන පයින් වගේද ?"

"ඒ වගේ තමා." නිරංජලා සිනාසුනාය. "මල්ලි ඔයා කිව්වනෙ- අර ගාට් වලට බෝට්ටු යනවා. ඒ බෝට්ටුවල සමනලියො යනවා කියලා ගාටියට ? "

"ඔව් !"

"ඔයා කැමතිද සමනලියෙක් වගේ යන්න ?"

"ඒ කොහොමද ?"

"එන්න කියන්නම්. කාලා ඉවර නං අත හෝදන් එන්න."

නිරංජලා බිමල්ව කැඳවූව ගියේ ඇගේ සැලෝන් එක තුළටයි.

"මෙතන වාඩිවෙන්න" නිරංජලා බිමල්ව කැඩපතක් ඉදිරියේ පුටුවක වාඩි කෙරෙව්වාය. "ඔයාගෙ මූණ දැක්ක වෙලාවෙ ඉඳල මං බලන් හිටියෙ ඔයාගෙ මූණෙ බෝන් ස්ට්‍රක්චර් එක."

"බෝන් ස්ට්‍රක්චර් ? මට ඕවා, තේරෙන්නෙ නෑ අක්කා !"

"ඔයාගෙ මූණෙ හැඩය. මේ කම්මුල් ඇට පිහිටල, තියෙන විදිය- මේකප් දාන්න අපූරු මූණ !"

"මේකප් දාන්න ?"

"ඔව් ඔහොම ඉන්නකෝ" කී නිරංජලා තෙත කඩකින් බිමල්ගේ මූණ තෙත මාත්තු කර පිසදා මූණේ වත්සුනු ද්‍රවණයක් ආලේප කළාය. රං දැනට ඈ එය මත්තේ තවත්

චව් වැනි ආලේපයක් යොදා දෙකම්මුල 'බ්ලශ්' නම් ලා රතු පැහැයක් ඉතුරා දෙඇස් වටා අඳුන් ආලේප තැවරුවාය. ඇගේ බැම සකස් කර දෑස් පියන් වලට දිග ඇති පිහාටු ඇලෙව්වාය. දෙතොල රතු සායම් තැවරුනි. තමාගේම මේ ඇස් ඉදිරිපිට පෙනෙන තමාගේම විපර්‍යාසය දකිමින් බිමල් සිනාසෙන්නට වූයේය.

"ඔහොම ඉන්න! ඔහොම ඉන්න!" කී නිරංජලාද සිනාසෙන්නට වූවාය.

අන්තිමේදී ඇය ස්ටයිරොෆෝම් ඉස් හැඩයක් මත්තේ රඳවා තිබූ බොරු කොණ්ඩයක් ගෙන, බිමල්ගේ හිස වැසෙන්නට දැම්මාය

මොහොතකට දෙදෙනාම ගොළු වූහ. කොතරම් වෙනසක්ද? බිමල්ගේ පපුව වේගයෙන් ගැහෙන්නට විය.

'කෙල්ලෙක් උනා නම් එක්ක යන්න තිබුණා' යි මෙසා රගසේ කී වදන් ඔහුට මේ දැන් ඇසෙන්නාක් මෙන්විය.

"මොකද හිතෙන්නෙ මල්ලි?" නිරංජලා ඇසුවාය.

බිමල්ගේ ඇසක කඳුලක් මතුවිය.

"ඇයි මල්ලි?"

"නෑ තාත්තා මං පොඩි කාලෙ කිව්වෙ මටත් නංගියෙක් ඉඳීවි කියල, ඉතිං අපිට නංගියෙක් හම්බ උනේ නෑනෙ? දැන් මට මේ කණ්ණාඩියෙන් පේන්නේ ඒ හම්බ වෙච්ච නැති නංගිව."

නිරංජලා බිමල්ට ඇස පිසදා ගන්නට ටිෂ්‍යූ කඩදාසියක් දුන්නාය.

"කඳුළු හලන්න එපා මල්ලි එක්කොම මැස්කාරා දිය වෙනවා"

"නෑ නෑ" කී බිමල් කඳුළු පිස දැමුවේය

නිරංජලා කොණ්ඩයටම ඇලවෙන කරාබු යුගලකුත් බිමල්ගේ දෙකණේ ලෑවාය..

"ඔයා පොඩ්ඩක් උස මහත නැති නිසා මල්ලි, ඇඳුමක් හොයා ගන්නත් ලේසියි. දැන් ඔයාට තියෙන්නෙ අර බෝට්ටුවට නගින විදියක් හදා ගන්න."

"මං මේ දැනුත් ඒ ගැන හිත හිතා හිටියෙ මගෙ ඔළුවෙ ප්ලෑන් එකක් ඇඳෙනවා."

"ඔයා දන්නවනෙ ඔයාට ඕනෑ වෙලාවක මම උදව් කරනවා. කලබල වෙලා වැඩේ ගජ්ජ ගන්න එපා. අපි බලමු. පියතිලක මොනවද හොයාගෙන එන්නෙ කියලා."

"මං හිතන්නෙ නෑ පියතිලක මොනවත් හොයා ගනීවි කියලා."

"බලමුකො. මල්ලි දැන් ඉතිං මොකද කරන්නෙ?"

"මං ඉතිං ගෙදර යනවා. අම්මා අරෙහෙ බයවෙලා ඇති. තමන් නිසාට තම අතමය කියල අපේ ප්‍රශ්න අපිම විසඳ ගන්න ඕනෑ."

"ඒක හරි මල්ලි. ඔයා ආයෙත් එනවනෙ?"

"අක්කා හිතනවට කලින් මං එනවා. මගේ පලූන් එක හෙමින් කීරුවේ කියන්නම්කො."

"ඒ අතරේ අපි ප්‍රාර්ථනා කරමු තාත්තා ගෙදර වීව් කියලා. ඒ ආවේ නැත්නං---"

"ඒ ආවේ නැත්නං... දවස් කීයක් බලං ඉන්නද අක්කෙ? අද මං අර මුස්පේන්තු මිනිහගෙ මූන දැකපු ඉදිරියෙම දැක්කා. මිනිහ දරුණුයි- මට තේරෙනවා - හිතක් පපුවක් නෑ. මිනිහෙකුගෙ හදවත කියන්න ප්‍රේමය ඇස් දෙකෙන්."

"මල්ලි දැන් ඔය මූන හෝදල කාගන්න. මං ඔයාට ඕනෑ වෙලාවක සේරම හරි ගජ්ජල දෙන්නං."

"තෑන්ක් යූ අක්කෙ." බොරු කොරන්ඩිය ඉවත් කරමින් බිමල් තම දෙනෙතින් කඳුලු ඇස්බොන්නට ඉඩ හැරියේය.